සැ. යු. - (i) 2017.07.07 වැනි දින පළ වූ අංක 2027 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2017 වර්ෂය සඳහා පොළොන්නරුව අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල සහ දෙමළ භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,028 - 2017 ජූලි මස 14 වැනි සිකුරාදා - 2017.07.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1350 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1351 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1356 |


සැ. යු. -(i) පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිඩ්නි ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ජේ ශ්‍රී රංගා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 අගෝස්තු මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජූලි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පැමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2017.07.30 වැනි ඉරිදා පෙ.ව 9.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

ඒ. නිශාන්ත පීරිස්,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගාල්ල.

2017 ජුනි මස 13 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| 01. | 7286 | පා පැදිය | 01 |
| 02. | 70860 | පා පැදිය | 01 |
| 03. | ඒආර් 439/17 | පා පැදිය | 01 |
| 04. | ඒආර් 411/17 | පා පැදිය | 01 |
| 05. | ඒආර් 791/17 | පා පැදිය | 01 |
| 06. | අංක රහිත | දිරාපත් පා පැදි | 01 |
| 07. | අංක රහිත | දිරාපත් පා පැදි | 01 |
| 08. | අංක රහිත | දිරාපත් පා පැදි | 01 |
| 09. | 72942 | උණු වතුර ලබා ගන්නා ඉලෙක්ට්‍රික් උපකරණ | 01 |
| 10. | ඒආර් 3139/14 | ඩ්‍රිල් | 01 |
| 11. | 33343 | පිහිය | 01 |
| 12. | 59080 | පිහිය | 01 |
| 13. | අංක රහිත | යකඩ ඉණිමං | 02 |
| 14. | අංක රහිත | දිරාපත් යකඩ ගේට්ටු | 01 |
| 15. | 35347 | පොරව | 02 |
| | | වක් පිහි | 01 |
| 16. | 69026 | අත් පොරව | 01 |
| 17. | 69027 | අත් පොරව | 01 |
| | | පීර | 01 |
| | | ස්පැනර් | 01 |
| | | මිටිය | 01 |
| 18. | 93972 | යකඩ බාල්දි | 01 |
| | | සවල් | 01 |
| 19. | 73402 | යකඩ බාල්දි | 01 |
| | | සවල් | 01 |
| 20. | 71772 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ලිප් | 01 |
| 21. | 71888 | ගෑස් සිලින්ඩර් | 01 |
| 22. | 69890 | උදලු | 01 |
| | | සවල් | 01 |
| | | අලවංගු | 01 |
| | | පොල් පරාල | 04 |
| | | අඟල් 02 වතුර බට | 01 |
| | | කඹය | 01 |
| | | වතුර මොටර් | 02 |
| 23. | අංක රහිත | ගෑස් ලිප් | 11 |
| 24. | අංක රහිත | දිරාපත් යතුරු ලියන කිහිපයක කොටස් | |
| 25. | අංක රහිත | දිරාපත් සිටුවන විදුලි පංකා කොටස් | 04 |
| 26. | අංක රහිත | දිරාපත් මේස විදුලි පංකා කොටස් | 03 |
| 27. | අංක රහිත | දිරාපත් සිවිලිම් විදුලි පංකා කොටස් | |
| 28. | අංක රහිත | දිරාපත් කැරකැවෙන පුටුවක කොටස් | |
| 29. | අංක රහිත | ප්ලාස්ටික් හෝර්ස් කැබලි | තොගය |
| 30. | අංක රහිත | වීදුරු බෝතල් | තොගය |
| 31. | අංක රහිත | දිරාපත් වතුර මෝටර් | 01 |
| 32. | ඒආර් 363/17 | එස්. පී. එම්. එම්. 5866 ය/පැදි | 01 |
| 33. | ඒආර් 438/17 | එම්. වයි. 6602 ය/පැදි | 01 |
| 34. | ඒආර් 384/17 | එස්. පී. එම්. වී. 3789 ය/පැ | 01 |
| 35. | 54862 | ව්‍යාජ ලෙස සකසන ලද ය/පැදි | 01 |
| 36. | 63819 | එස්. පී. ජේ. ඩබ්. 8040 ය/පැදි | 01 |
| 37. | 81924 | මෝපෙඩ් වර්ගයේ ය/පැදි | 01 |
| 38. | අංක රහිත | ප්ලාස්ටික් බූලි | 10 |
| 39. | 87571 | 114-5903 ය/පැදි | 01 |
| 40. | 46421 | එස්. පී. ටී. එස්. 6736 ය/පැදි | 01 |
| 41. | 93941 | එස්. පී. ජේ. වයි. 9811 ය/පැදි | 01 |
| 42. | 62248 | එස්. පී. ජී. ආර්. 1151 ය/පැදි | 01 |
| 43. | 23413 | ඩබ්. පී. එම්. එච්. 5556 ය/පැදි | 01 |

| | | | |
|---|---|---|---|
| 44. | අංක රහිත | දිරාපත් ලිප් | 01 |
| 45. | 99844 | ඩබ්. පී. ජේ. වී. 1046 ය/පැදි | 01 |
| 46. | 82854 | 118-8435 ය/පැදි | 01 |
| 47. | 73270 | එස්. පී. ටී. ජේ. 9901 ය/පැදි | 01 |
| 48. | 89590 | එච්. ජී. 8293 ත්‍රීරෝද රථය | 01 |
| 49. | 64988 | එස්. පී. ජී. ඒ. 9419 අත්ට්‍රැක්ටර් | 01 |
| 50. | අංක රහිත | කුඩා ෆයිබර් ග්ලාස් ටැංකි | 01 |
| 51. | අංක රහිත | දිරාපත් ලොන්සින් ය/පැදි | 01 |
| 52. | 82069 | අත්ට්‍රැක්ටර් එන්ජිම හා ටේලරය | 01 |
| 53. | 64519 | අත්ට්‍රැක්ටර් එන්ජිම හා ටේලරය | 01 |
| 54. | 64281 | අත්ට්‍රැක්ටරය හා ටේලරය | 01 |
| 55. | 50742 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 56. | 62579 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 57. | 53432 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 58. | 59167 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 59. | 45204 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 60. | 62580 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 61. | 50047 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 62. | 66856 | ලී පාරු | 01 |
| 63. | අංක රහිත | බැරල් | තොගය |
| 64. | 73923 | ගෑස් සහිත ගෑස් සිලින්ඩර | 01 |
| 65. | 57624 | අඩි 1 හා අඩි 2 ප්‍රමාණයේ කම්බිකුරු කිහිපයක් | |
| 66. | අංක රහිත | දිරාපත්ව ඇති රිම් සහිත ටයර් | 04 |
| 67. | අංක රහිත | අඟල් 6 විශ්කම්භය ඇති ගලිබට කිහිපයක් | |
| 68. | අංක රහිත | ෆාම් මාස්ටර් වර්ගයේ ට්‍රැක්ටර් එන්ජිම් සහ ටේලර | 01 |
| 69. | ඒ. ආර්. 2635/17 | ඩබ්. පී. ඩබ්. අයි. 4724 යතුරු පැදි | 01 |
| 70. | ඒ. ආර්. 2636/17 | ඩබ්. පී. එම්. එල්. 4380 යතුරු පැදි | 01 |
| 71. | ඒ. ආර්. 2637/17 | එස්. පී. එච්. කිව්. 9142 යතුරු පැදි | 01 |
| 72. | ඒ. ආර්. 2638/17 | 128 ශ්‍රී 2732 යතුරු පැදි | 01 |
| 73. | ඒ. ආර්. 2639/17 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදි | 01 |
| 74. | ඒ. ආර්. 2640/17 | ඇලුමිනියම් යූ බාර් | කිහිපයක් |
| 75. | ඒ. ආර්. 921/17 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 76. | අංක රහිත | දිරාගිය වීල් බැරෝ | 01 |
| 77. | ඒ. ආර්. 2997/17 | අංකය අපැහැදිලි පා පැදි | 01 |
| 78. | ඒ. ආර්. 2998/17 | ටයිල් පෙට්ටි | 03 |
| | | පිඟන් ගඩොල් බේසම් | 01 |
| 79. | ඒ. ආර්. 2996/17 | ස්ලෝන් පයිප්ප | 18 |
| | | ග්‍රයින්ඩර් | 01 |

07-329

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

නම : සිලෝන් මෝටර් මියුසියම් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. බී. 5399
ලියාපදිංචි ලිපිනය : 16/3, ගැමුණු මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල.

එල්. ඕ. එල්. සී. කෝපොරේට්,
සර්විසස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2007 ජුනි මස 20 වැනි දින.

07-316

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9(1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : විවැලිව් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 122972
සංස්ථාගත කළ දිනය : 2017.06.09
ලිපිනය : අංක 311, මිලේනියම් සිටි, අතුරුගිරිය.

සමාගම් ලේකම්.

07-314

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බලංගොඩ මිරිස්වත්තේ පදිංචි පී. ඩබ්ලිව්. ආර්. ඩී. බී. ආර්. වීරසේකර වන මා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී. වන්නිආරච්චි මහතා විසින් ලියා සහතික කළ අංක 4306 දරන 08/09/13 වැනි දින ප්‍රකාශයට පත් කළ ඇටෝර්නි බලපත්‍රය 2017.05.16 වැනි දින සිට අවලංගු කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පී. ඩබ්ලිව්. ආර්. ඩී. බී. ආර්. වීරසේකර.

07-326

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

නම : අයිටෙක් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (පීවීටී) එල්ටීඩී
අංකය : පී වී 79314
ලිපිනය : අංක 08, නුවර පාර, කිරිබත්ගොඩ.

07-335

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි.

සමාගමේ නාමය : ආන්යා එම්. ජී. ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123096
ලියාපදිංචි ලිපිනය : අංක 33/ඒ රේමන් පාර, නුගේගොඩ.

සමාගම් ලේකම්.

07-347

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 ජුනි මස 12 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඉන්ටෙලි ඇනලිටික්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 122996
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 257, පාසැල් පටුමග, බොරලැස්ගමුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

07-352

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 අප්‍රේල් මස 26 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ගැරබැන්ක් මෝටර් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121899
ලියාපදිංචි කාර්යාලය : අංක 12, දෙස්තර ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 05.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-361

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 මාර්තු මස 17 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : පෙපර් කන්වර්ටර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120912
ලියාපදිංචි කාර්යාලය : ලක්කුම් ඉල්ලම් වරුසප්ලම් චුන්නාකම්.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-362

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 අප්‍රේල් මස 03 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ලිබර්ටි පොලිමර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121373
ලියාපදිංචි කාර්යාලය : අංක 26, ශ්‍රී සද්ධර්ම මාවත, කොළඹ 10.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-363

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 මාර්තු මස 16 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ශ්‍රිසිම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120890
ලියාපදිංචි කාර්යාලය : අංක 132/22, තලාහේන, මාලඹේ.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-364

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 පෙබරවාරි මස 20 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඩබ්ලිව් වන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120219
ලියාපදිංචි කාර්යාලය : අංක 201, කඩුවෙල පාර, තලංගම උතුර, බත්තරමුල්ල.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-365

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 අප්‍රේල් මස 17 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : කළම්බු එපාර්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 121649
ලියාපදිංචි කාර්යාලය : අංක 12බී - 2/1, සෙගල් කොම්, දුම්රියපොල පාර, කොළඹ 06.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-366

## පොදු නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 ජේදයේ නියමයන්ට අනුකූලව ''හේලීස් ඉන්ඩස්ට්‍රියල් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නාමය ''හේලීස් ඇවන්චූරා (ප්‍රයිවට්) ලිමිටඩ්'' වශයෙන් වෙනස් කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ජේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම කලින් හැඳින්වූ නාමය : හේලීස් ඉන්ඩස්ට්‍රියල් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී බී 753 පී වී
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සමාගමේ නව නාමය : හේලීස් ඇවන්චූරා (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10,
2017 ජුනි මස 14 වැනි දින.

07-373

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2017 ජුනි මස 21 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : සදර්න් ක්‍රොස් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123291
ලියාපදිංචි කාර්යාලය : 03 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04

එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල්
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

03 වන මහල, අංක 11,
කාසල් පටුමග,
කොළඹ 04.

07-394

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 ජුනි මස 22 වැනි දින සංස්ථාගත කරන ලදී.

නම : රිසර්ච් ඉන්ටෙලිජන්ස් යුනිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 122823
ලිපිනය : අංක 601/1, හල්ගහදෙණිය පාර, රාජගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ,
සීඑල්සී සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-395

### නිවේදනයයි

ෆවුන්ඩේෂන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 2646) හා ජිනදාස මාර්සිල්කා (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 2069) ඒකාබද්ධ කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 242 (3) (b) අනුව නිවේදනය කරන වගනම් ඉහත සඳහන් එක් එක් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2016 ජුනි මස 21 හා 22 දිනවල සම්මත කරගන්නා ලද යෝජනාව ප්‍රකාරව ෆවුන්ඩේෂන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා ජිනදාස මාර්සිල්කා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 242 (1) වගන්තිය අනුව ඒකාබද්ධ කිරීමට තීරණය කරන ලදී.

ඒකාබද්ධ සමාගම ෆවුන්ඩේෂන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් හඳුන්වනු ලබන අතර මෙම ඒකාබද්ධ කිරීම වර්ෂ 2017 අගෝස්තු මස 16 වැනි දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චය කරන ලද දිනයකට ක්‍රියාත්මක වනු ඇත.

මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාව ඉහත සමාගම් පනතේ අංක 242 (4) වගන්තිය අනුව අනුමත කරන ලද යෝජනාවක් ලෙස සලකනු ලබන අතර එය සමාගමේ කොටස් හිමියෙකුට හෝ ණය හිමියෙකුට හෝ සමාගම විසින් බැඳීමක් දරන කෙනෙකුට 35, බලපොකුන පාර, කිරුලපන, කොළඹ 06 යන ස්ථානයේ ව්‍යාපාර වේලාවන්හි පරීක්ෂා කළ හැක.

ෆවුන්ඩේෂන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,<br>
ජිනදාස මාර්සිල්කා (ප්‍රයිවට්) ලිමිටඩ්,<br>
සමාගම් ලේකම්.

07-384

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 5 (2) දරන ප්‍රකාශනය යටතේ නිවේදනය කරමු :

සමාගමේ නම : හොටෙල් කුරුම්බා (ප්‍රයිවට්) ලිමිටඩ්<br>
ලියාපදිංචි අංකය : පී වී 111380<br>
සංස්ථාපනය කළ දිනය : 2016.01.20<br>
ලියාපදිංචි සමාගම් කාර්යාල ලිපිනය : අංක 2/36, නුවර පාර, නිට්ටඹුව,<br>
දැනුම් දෙනු ලබන්නේ : සමාගම් ලේකම්.

07-389

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 5 (2) දරන ප්‍රකාශනය යටතේ නිවේදනය කරමු :

සමාගමේ නම : සන්රේ ඔටෝ ඉන්ජිනියරිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>
ලියාපදිංචි අංකය : පී වී 70442<br>
සංස්ථාපනය කළ දිනය : 2009.12.21<br>
ලියාපදිංචි සමාගම් කාර්යාල ලිපිනය : අංක 455, නාරන්ගොඩ පාලුව, බටුවත්ත, රාගම<br>
දැනුම් දෙනු ලබන්නේ : සමාගම් අධ්‍යක්ෂක

07-390

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ :

සමාගමේ නම : රෙයින්ලංකා ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 122423<br>
ලියාපදිංචි කාර්යාලය : අංක 313, ගෝනාවල, කැලණිය<br>
සංස්ථාපනය කළ දිනය : 2017.05.30

ලේකම්.

2017 ජුනි මස 21 වැනි බදාදා.

07-412

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ, පහළගම, අංක 4 ඒ හි පදිංචි ගාර්දියේ පුංචිහේවාගේ ඉන්දික කෞශල්‍ය සුරවීර ද සිල්වා වන මම එස්. එන්. ජයවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2006.09.19 වැනි දින ලියා සහතික කළ අංක 455 ඇටර්නි බලපත්‍රයෙන් ගම්පහ, පහළගම, අංක 4 ඒ හි පදිංචි වැලිසරගේ ඉන්ද්‍ර රූපසිංහ මහත්මියට දෙන ලද ඇටර්නි බලය අවලංගු කළ බව මෙයින් දන්වමි.

07-417

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වෙන්නප්පුව මැද දුම්මලදෙණිය, රෙජිස්ට්‍රාර් පාර, අංක 189 ඒ (A) හි පදිංචි වනසිංහ වාසල මුදියන්සේලාගේ ප්‍රදීප් චන්ද්‍රලාල් ජයමහ වන මා වෙන්නප්පුව මැද දුම්මලදෙණිය, රෙජිස්ට්‍රාර් පාර අංක 189 ''ඒ'' (A) හි පදිංචි අකුරුගොඩ පතිරණගේ නෙලුම් දීපිකා මනෝහරී වෙත ප්‍රදානය කරන ලද ඩබ්. ශ්‍රීනා නිලුක්ෂි තිසේරා නීතිඥතුමිය විසින් වර්ෂ 2015.08.17 වැනි දින ලියා සහතික කළ අංක 2245 දරන ඇටෝර්නි බලපත්‍රය මෙහි සඳහන් අද දින සිට එනම් 2017.06.30 දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය ඉදිරියට බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

වනසිංහ වාසල මුදියන්සේලාගේ ප්‍රදීප් චන්ද්‍රලාල් ජයමහ.

07-419

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙලිඅත්ත, තංගල්ල පාර, ''නිලුපුල්'' හි පදිංචි දියොක්සෝ චෝයි සහ ආමන්ත ඉමේෂ් විජේතුංග වන මියන්ග් මූන් ඔටෝ ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් (පී. වී. 109013) දරන සමාගමෙහි අධ්‍යක්ෂවරුන් වශයෙන් එකී සමාගම වෙනුවෙන් මාතර, තොටමුණ වැල්ලවත්ත පාර අංක 70 හි පදිංචි අජිත් රෝහණ හෙට්ටිහේවා යන අය වෙත බලය පවරමින්, ප්‍රසිද්ධ නොතාරිස් තිලිනි තෙන්නකෝන් විසින් වර්ෂ 2015.10.22 වැනි දින ලියා සහතික කරන ලද අංක 56 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදුකරන කිසිදු ක්‍රියාවන්ට මියන්ග් මූන් ඔටෝ ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම හෝ එහි අධ්‍යක්ෂවරුන් වන අපගේ කිසිදු වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආමන්ත ඉමේෂ් විජේතුංග.

07-436

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 ජුනි මස 09 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : පීක් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 122957
ලියාපදිංචි කාර්යාලය : කුච්චම් ලේන්, වැල්වෙට්ටිතුරේ, යාපනය.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස්
ඇන්ඩ් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-443

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2017 ජුනි මස 05 වැනිද ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ද වයින් කොන්සිජ්ග් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 122841
ලියාපදිංචි කාර්යාලය : අංක 53/27 ටොරින්ටන් ඇව්නිව්, කොළඹ 07.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස්
ඇන්ඩ් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-444

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : හාඩිං බුටික් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 122378
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2017.06.01

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-447

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : හාඩිං ප්‍රොපර්ටි ග්‍රූප් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 123035
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2017.06.13

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-448

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කළ බවට කරනු ලබන දැන්වීමයි.

සමාගම් නාමය : එස්. ටී. එස්. ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ්

සමාගම් අංකය : පීවී 122578

ලියාපදිංචි කාර්යාලය : 7 ඔලම්ස් පෙදෙස, කොළඹ 08

ලේකම්.

07-456

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉන්ටර්නැෂනල් පොලිමර් ප්ලස් (පී. වී. ටී.) එල් ටී ඩී

සමාගම් ලියාපදිංචි අංකය : පී වී 116047

සමාගම් ගත කළ දිනය : 2016 අගෝස්තු 26

ලියාපදිංචි ලිපිනය : අංක .3 අනියකන්ද පාර, නාගොඩ, කඳාන

සමාගම් ලේකම්වරු.

07-457

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. කේසර් වීදිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

#### පළමු උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළේ සහ මහනුවර කඩවත් සතරේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හීරස්සගල අංක 242 ග්‍රාම නිලධාරි වසමේ බෝවල - සුදුහම්පොළ හි පිහිටි හීරස්සගල පාරේ වරිපනම් අංක 195/8/සී දරන ''හීරස්සගල සහ රිච්මන්ඩ් හිල්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම්. යූ. බී. දසනායක විසින් 1999 ජූලි මස 18 වැනි දින මැන සාදන ලද අංක 105 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 දරන ප්‍රමාණය පර්චස් පහළොව (අ. 0 රූ. 0 පර්. 15) විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

#### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහගල්ගොඩ මොරගොඩකෝරළේ අංක 479ඩී, ග්‍රාම නිලධාරි වසමේ උතුරු තලංගම හි පිහිටි වැව පාරේ වරිපනම් අංක 240/40ඒ දරන ඇවරිහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. පී. එල්. ඩී. සිල්වා විසින් 2006 ඔක්තෝබර් මස 22 වැනි දින මැන සාදන ලද අංක 1851 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් සී 1 දරන පර්චස් අටයි දශම පහයි පහ (අ. 0 රූ. 0 පර්. 8.55) විශාල ඉඩම ගොඩනැගිලි, ගසකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

පාරක් සඳහා වෙන්කරන ලද මාර්ගය මතුපිටින් හා ඒ දිගේ එහා මෙහා යාමේ ඇති නිදහස් අයිතිය සමග වේ.

1. එකී උතුරු තලංගම හි පිහිටි ඇවරිහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 1990 අගෝස්තු මස 23 වැනි දින මැන සාදන ලද අංක 1308 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් ජේ (මීටර් 4.5ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ප්‍රමාණය (අ. 0 රූ. 0 පර්. 15)

2. එකී උතුරු තලංගම හි පිහිටි ඇවරිහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඕ. ජී. විජේසිංහ විසින් 1989 මැයි මස 16 වැනි දින මැන සාදන ලද අංක 2291 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 4 ප්‍රමාණය (අ. 0 රූ. 0 පර්. 21)

නුගේගොඩ, නාවල පාරේ අංක 90/3, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රිජා සෙරමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත 1 සහ 2 උපලේඛනවල සඳහන් කළ දේපළ

2 වන උපලේඛනයේ ලොට් සී 1 (අ. 0 රූ. 0 පර්. 8.55)
වර්ෂ 2017ක් වූ අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 10.30 ට

1 වන උපලේඛනයේ ලොට් 1 (අ. 0 රූ. 0 පර්. 15)
වර්ෂ 2017ක් වූ අගෝස්තු මස 11 වැනි දින ප. ව. 1.00 ට

ඉහත ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.05.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.07.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2017.07.17 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* -

### 1 වන උපලේඛනය

අදාළ දේපළට ලඟාවීම සඳහා මහනුවර දුම්රිය ස්ථානයේ ලඟ සිට විලියම් ගොපල්ලව මාවතේ කි. මී. 1.5ක් පමණ ගමන් කළ විට හිරස්සගල පාර හංදිය හමුවේ. හිරස්සගල පාරේ කි. මී. 2ක් පමණ ගමන් කළ විට රිච්මන්ඩ් හිල් පාර හංදිය හමුවේ. එතැනින් වමට හැරුණු විට ඇති රිච්මන්ඩ් හිල් පාරේ මීටර් 100 ක් පමණ ගමන් කර නැවත දකුණට හැරී මීටර් 50 ක් පමණ ගමන් කළ විට වරිපනම් අංක 195/3 දරන අදළ දේපළ හමුවේ.

### 2 වන උපලේඛනය

පැලවත්ත හංදියේ සිට තලංගම බත්තරමුල්ල පාරේ ගමන් කර අකුරේගොඩ පාරේ කි. මී. 1.5ක් ගමන් කර දකුණට හැරුණු විට ලේක් පාර හමුවේ. එම පාරේ කි. මී. 1.7ක් ගමන්කර දකුණට හැරුණු විට නගර සභා කරත්ත පාර හමුවේ. නගර සභා පාරේ මීටර් 100ක් පමණ ගොස් වමට හැරුණු තිබෙන අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කර ඇති කොටසේ මීටර් 75ක් පමණ ගමන් කළ විට අදාළ දේපළට ලඟාවිය හැක. මෙම දේපළ පිහිටා ඇත්තේ හැරවුම් වටයට මායිම්ව ය.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(10) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු යි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කේසර් වීදිය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෝෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,

අංක 200, 2 වැනි මහල උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011 - 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 32,
කේසර් වීදිය,
කොළඹ 11,
දුරකථන අංක 011 2336773-4,
ෆැක්ස් අංකය : 011- 2336231.

07-392

---

### සෙලාන් බැංකුව පීඑල්සී - වැලිවේරිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල නුගේගොඩ සිය ලියාපදිංචි අංක පීවී 12987 ඇති 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන දිනෝටා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නුගේගොඩ පදිංචි කලුගම්පිටිය අප්පුහාමිලාගේ දෙන් මහේෂ් සමිත කලුගම්පිටිය යන අය බන්ධනාදයි වශයෙන් සෙලාන් බැංකුන පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අමුණුගොඩ ග්‍රාමසේවා වසම තුළ ඉඹුල්ගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෙරු අයි. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් විසින් සාදන ලද 2005.12.02 දිනැති අංක 1860-2කේ දරන සැලැස්මේ නිරූපිත ෆ්‍රැන්ක්ෆර්ට් එස්ටේට් නැමැති ඉඩමේ ලොට් බී1 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1860-කේ සැලැස්ම අනුව අක්කර අටයි රූඩ් දෙකයි පර්චස් තිස් තුනක් (අ:8, රූ:2 පර්:33) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත කී ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමකි.

පෙර කී ඉඹුල්ගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෙරු එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද 1982.06.29 දිනැති අංක 47/82 දරන සැලැස්මේ නිරූපිත "ෆ්‍රැන්ක්ෆර්ට් එස්ටේට්" නැමැති ඉඩමේ ලොට් බී ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 47/82 දරන සැලැස්ම අනුව අක්කර අටයි, රූඩ් දෙකයි, පර්චස් තිස් තුනක් (අ:8, රූ:2, පර්:33) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපල 2017 අගෝස්තු මස 10 වැනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-* කොළඹ නුවර මාර්ගයේ පිහිටි කළුවල හංදියේ සිට කළුවල මාර්ගය ඔස්සේ කි.මී. 0.8 ක පමණ දුරක් ගොස් වම්පසට ඇති තාර පාරට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 200 ක පමණ දුරක් ගිය විට මාර්ගය අවසානයේ අදළ දේපල පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2016.06.17 වන දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2016.06.15 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2016.06.09 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

(01) ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) (02) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකයි) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකයි දශම පහයි) (04) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පී. එල්. සී වෙත ගෙවා නිමකල යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිති ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. : ප්‍රධාන කළමණාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක: 011 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 2572940

07-416

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 5481283, 8625118, 71784501

බෙරලපනාතර, මිහිරාණි හි පදිංචි ගමගේ ආරියසේන මහතාට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 අප්‍රේල් 12 දිනැති අංක 2015 දරන *ගැසට් පත්‍රයේ* හා 2017 මාර්තු 31 දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්", යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු අඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2017 අගෝස්තු 22 වෙනි දින පෙ.ව 11.00 ට, කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### ඉහත සඳහන් පළමු උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක කෝරලේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පස්ගොඩ ප්‍රාදේශීය

සහා සීමාවේ බෙරලපනතර පිහිටි "ඕවිටවත්ත" නමැති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට ඊරියමුල්ල ද නැගෙනහිරට අඹගහවක්කඩ සහ රජ්ජුගහවත්ත හෙවත් රනහිගෙවත්ත ද දකුණට මැදගොඩවත්ත ද බස්නාහිරට කපතැනුම ද මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන එහි ඇති පස්, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ. මෙය කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C6/119 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඒ. සමරක්කොඩි විසින් සාදන ලද 2004 මාර්තු 3 දිනැති අංක 1334 දරන මෑතකදී සාදන ලද පිඹුරෙහි ද නිරූපණය කර ඇති මේ ඉඩම පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී බෙරලපනතර පිහිටි "ඕවිටවත්ත" නමැති ඉඩමෙහි ලොට් 1 ලෙස දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට ඊරියමුල්ල ද නැගෙනහිරට අඹගහවක්කඩ සහ කජ්ජුගහවත්ත හෙවත් රන්හිංගෙවත්ත දකුණට මැදගොඩවත්ත ද බස්නාහිරට කපතැනුම ද මායිම්ව අංක 1334 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් විසිතුනක (අ. 0, රූ. 1, පර්. 23) බිම ප්‍රමාණයකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී. ඒ. මාධව,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
ඌරුබොක්ක ශාඛාව.

07-451

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 7288986, 9941851

මාතර, සෙන්ට්‍රල් පාර කොටුව, අංක 06 හි කේ. ටී. විජේසේකර මහතා සහ ඒ. එම්. විජේසේකර මහත්මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 ඔක්තෝබර් 04 දිනැති අංක 1831 දරන ගැසට් පත්‍රයේ හා 2013 සැප්තැම්බර් 23 දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්", යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2017 ජූලි 28 වෙනි දින පෙ.ව 10.00 ට, මාතර, කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ අංක 39 පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, මාතර මහ නගර සභා සීමාව තුළ මාතර කොටුවේ අංක 416 C දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ පිහිටි කොම්පැන්යේ ලිඳගාවවත්ත නොහොත් කොහොඹගහවත්ත නමැති, බර්ටන් හවුස් ලෙසද ප්‍රසිද්ධ ඉඩම එහි ඇති සියලු ගොඩනැගිලිද ඇතුළුව වරිපනම් අංක 15 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් විසින් සාදන ලද 2003 සැප්තැම්බර් 12 දිනැති අංක 778 දරන පිඹුරෙහි ලොට් අංක A ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති ලොට් A උතුරට විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත ද නැගෙනහිරට වරිපනම් අංක 6 (පරණ අංක 106) දරන ස්වස්තික නමැති පරිශ්‍රයද දකුණට සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද අංක 1441 දරන පිඹුරෙහි ඇති එම ඉඩමේම ලොට් 1ද, බස්නාහිරට වරිපනම් අංක 103 දරන කොහොඹ ගහවත්තේ කොටසක් ද මායිම්ව එකී අංක 778 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි හතක (අ.0, රූ.0, ප.27) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩමේ බිම සහ එහි පිහිටි සියලු ගහකොළ සහ ගොඩනැගිලි ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A456/28 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. ආර්. ප්‍රියංග,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව
දෙවිනුවර.

07-452

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බලපිටිය දිසා අධිකරණයේ දී ය

අම්බලන්ගොඩ, ගාලු පාරේ අංක 26 දරන ස්ථානයේ "අම්බලන්ගොඩ ශාඛාව" යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තාවූ කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සි.

............................*පැමිණිලිකරු,*

නඩු අංකය : 135/MB

*එදිරිව*

බටපොළ උඩුවිල අංක 105 දරන ස්ථානයේ "කේවින් කන්ට්‍රැක්ටර්ස්" යන නාමය හා විලාශය යටතේ ව්‍යාපාරයෙහි යෙදී සිටින වඩු මේස්ත්‍රි සුමිත් ප්‍රියන්ත.

..........................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 03 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත. ඒ අනුව ඉහත නම් සඳහන් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(අ) රු. 2,175,000 ක මුදලක් සහ රු. 139, 070.68 ක මුදලක් යනුවෙන් එකතුව රු. 2,314,070 ක් වන්නා වූ මුදලක් සහ එකී රු. 2,175,000 මුදල 2011 මාර්තු මස 29 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 9% බැගින් වැඩිදුර පොළිය ද ගෙවිය යුතු බවට ද,

(ආ) තව ද අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට, නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

(ඇ) තව ද ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා මෙහි සහ තීන්දු ප්‍රකාශයේ පළමුවන සහ දෙවන උපලේඛන වල විස්තර කර ඇති ඉඩම් බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කල හැකි බවට ද වැඩිදුරටත් තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 03 වැනි දින බලපිටිය දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ පිහිටි ස්ථානයේ දී, වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 04 වැනි දින පෙ.ව 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### ඉහත සඳහන් පළමුවන උපලේඛනය

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත වැල්ලබඩ පත්තුවේ බටපොල පිහිටි මහගංගොඩවත්ත නැමැති ඉඩමෙන් වූ අංක 01, 02, 03 සහ 08 දරන යාබද සහ ඒකාබද්ධ බිම් කැබැලි හතරේ අනුබෙදීමක් වන අංක 10 බිම් කැබැල්ල යනුවෙන් ලකුණු කර ඇති බෙද වෙන්කොට සීමා නිර්ණය කර තිබෙන බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ වැවිලි, ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. පී. රන්ජිත් ආනන්ද විසින් සාදනු ලැබ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයෙහි C795/25 හි ලියාපදිංචි කර ඇති අංක 725 සහ 2006.05.07 වැනි දින දරන සැලැස්මෙහි නිරූපිත පරිදි එකී අංක 10 බිම් කැබැල්ලට මායිම් උතුරට : අංක 1895 දරන සැලැස්මේ අංක 6 බිම් කැබැල්ල නැගෙනහිරට : අංක 1895 දරන සැලැස්මෙහි අංක 11 බිම් කැබැල්ල දකුණට : අංක 1895 දරන සැලැස්මේ අංක 17 බිම් කැබැල්ල (අඩි 10 පළල පාර), බස්නාහිරට අංක 1895 දරන සැලැස්මේ අංක 7 බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) හෙවත් හෙක්ටයාර් 0.05058 වේ. බලයලත් මිනින්දෝරු තැන්පත් ඩී. පී. මැන්දිස් විසින් සාදන ලද අංක 1895 සහ 1986.03.31 දින දරන සැලැස්මේ නිරූපිත අංක 17 බිම් කැබැල්ල ඉහලින් ඔස්සේ සහ යටින් මාර්ග අයිතිය සහ පරවශ්‍යතා සහිතවයි.

### ඉහත සඳහන් දෙවන උපලේඛනය

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත බටපොල පිහිටි විතාරණගේ වත්ත හෙවත් කඩේවත්තේ ඊසාන දිග කොටස යනුවෙන් හැඳින්වෙන ඉඩමේ අංක 1B බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති බෙදු වෙන්කොට සීමා නිර්ණය කරන ලද බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. බලයලත් මිනින්දෙරු කේ. කන්නන්ගර විසින් සාදන ලැබූ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයෙහි C804/43 හි ලියාපදිංචි කර ඇති අංක 957/2004 සහ 2004.08.08 දින දරන සැලැස්මෙහි නිරූපිත පරිදි ඊට මායිම් උතුරින් : ආරච්චිගෙවත්ත නැගෙනහිරට : අංක 4488 දරන සැලැස්මෙහි X බිම් කැබැල්ල සහ A1 බිම් කැබැල්ල (බෙලි අත්ත කුඹුර) දකුණට : බටපොළ සිට බද්දේගමට වැටී ඇති ප්‍රධාන පාර බස්නාහිරට : අංක 957/2004 දරන සැලැස්මේ එම ඉඩමේම අංක 1A බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය පර්චස් හයයි දශම එකයි බින්දුවයි (අ. 0, රූ. 0, පර්. 6.10) ක් හෙවත් හෙක්ටයාර් 0.01543 ක් වේ.

ඉඩමට පිවිසීම.- උඩුවෙල හංදියට පැමිණ එම හංදියට ඇති ඇත්කදුර පාරේ මීටර් 800 ක් පමණ ගිය විට සුහද සිමෙන්ති බ්ලොක් නමින් නාම පුවරුව හමුවේ. එතැනින් දකුණට හැරී මීටර්

කිහිපයක් ගියවිට වම් පසින් තාර දමන ලද පාරක් ඇත. එම පාර අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ.

1. ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ගෙවිය යුතුය. 2. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 10,500 3. සියලු ප්‍රචාරක වියදම් 4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු 5. රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු 6. ලිපිකරු, බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500 7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30 ක් ඇතුළත දී බලපිටිය දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුය.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

වාණිජ මහාධිකරණය සහ කොළඹ දිසා අධිකරණයේ
ගාල්ල දිසා අධිකරණයේ රාජ්‍ය හා වාණිජ බැංකු
බලයලත් වෙන්දේසිකරු.
අංක 200, 2 වන මහල උසාවිය පාර, කොළඹ 12.
දුරකතන / ෆැක්ස් අංකය : 011-2445393.
ඊමේල් : senaservice@sltnet.lk

සමරරත්න ඇසෝසියේට්ස්
නීතිඥවරු සහ නොතාරිස්වරු
අංක 810, 2 වන මහල,
මරදාන පාර, කොළඹ 10
දුරකතන අංක : 011-2672262/ 011-2672263.

07-393

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 74677276.

පිටකෝට්ටේ, 3 වන පටුමගෙහි අංක 3/5 හි පිහිටි දැනට නුගේගොඩ, නාවල පාරේ, අංක 55 හි පිහිටා ඇති සිරිපුර ඒජන්සීස් (පුද්ගලික) සමාගමෙහි උකස් කරන ලද දේපල විකිණීම.

අධ්‍යක්ෂවරු :
පිටකෝට්ටේ , සීවලී පෙදෙසෙහි අංක 581/2 හි පදිංචි

1. පරන පල්ලිය නීවුල නෙමින්ද ගුරුගේ මයා
2. සම්පා උදුලමාලි ගුරුගේ මිය

ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.06.09 දිනැති අංක 2023 දරන *ගැසට් පත්‍රයේ* හා 2017 මැයි 30 වන අඟහරුවාදා දින "ඩේලිනිව්ස් " , " දිනමිණ " හා " තිනකරන් " , යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2017.08.02 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර පිටකෝට්ටේ අංක 522 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටකෝට්ටේ පිහිටි 3 වන පටුමගේ වරිපනම් අංක 3/5 (පිටකෝට්ටේ 4 වන පටුමගෙහි පරණ වරිපනම් අංක 346/6) දරන " කෝංගහවත්ත" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් සාදන ලද 1976 ජූලි 8 දිනැති අංක 604 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 උතුරට : එකී අංක 604 දරන පිඹුරේ ලොට් 2 සහ 5 ද, නැගෙනහිරට : එකී අංක 604 දරන පිඹුරේ ලොට් 4 ද, දකුණට : එස්. ගුරුගේට අයත් ඉඩම ද බස්නාහිරට: බී. කරුණාපාලට සහ එච්. ගමගේට අයත් ඉඩම් ද මායිම්ව එකී අංක 604 දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම නවයයි බිංදුවක (අ. 0. රූ. 0. පර්. 16.90) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්2795/269 හි ලියාපදිංචි කර ඇත.ඕ

එකී ඉඩම, බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි සිල්වා විසින් මෑතක දී සාදන ලද 2000 පෙබරවාරි මස 10 දිනැති අංක එෆ්4/2000 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

එකී පිටකෝට්ටේ පිහිටි තෙවන පටුමගෙහි වරිපනම් අංක 3/5 දරන " කෝංගහවත්ත " නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව සාදන ලද අංක එෆ්4/2000 දරන

පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 උතුරට : එකී අංක 604 දරන පිඹුරෙහි එච්. ගමගේට අයත් ඉඩම ලොට් 2 සහ අඩි 20 පළල පාරද, නැගෙනහිරට : අඩි 20 පළල පාර සහ බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් සාදන ලද 1979 දෙසැම්බර් 18 දිනැති අංක 976 දරන පිඹුරෙහි ලොට් 4සී ද දකුණට : එස්. ගුරුගේට අයත් ඉඩමද, බස්නාහිරට : කරුණාපාල සහ එච්. ගමගේට අයත් ඉඩමද මායිම්ව අංක F4/2000 දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, රූ. 16.90) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2795/269 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී පිටකෝට්ටේ පිහිටි " කෝංගහවත්ත " නැමති ඉඩමෙහි අංක 604 දරන පිඹුරෙහි ලොට් 5 ( අඩි 10 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට 3 වන පටුමගද, නැගෙනහිරට එකී අංක 604 දරන පිඹුරෙහි ලොට් 4 ද, දකුණට අංක 604 දරන පිඹුරෙහි ලොට් 3 ද, බස්නාහිරට ලොට් 2 හා 1 ද මායිම්ව අංක 604 දරන පිඹුරට අනුව පර්චස් පහයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්.5.20) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 175/90 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. එම්. ඒ. මාධව මහතා,
ජ්‍යෝෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව
පානදුර අධිශ්‍රේණි ශාඛාව.

07-453

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය -9961238, 9961543

පුහුල්වැල්ල, කිරින්ද, දේවානන්ද නාහිමි මාවතේ, එස්. එම්. ඉන්ඩස්ට්‍රීස් ලංකා (පුද්ගලික) සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥා පනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 අප්‍රේල් 12 දිනැති අංක 2015 දරන ගැසට් පත්‍රයේ හා 2017 අප්‍රේල් 3 වැනි දින "ඩේලිනිව්ස් " , " දිනමිණ " හා " තිනකරන් " , යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2017 අගෝස්තු 03 වෙනි දින පෙ. ව. 11.30 ට, කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩපත්තුවේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවේ අංක 325සී මඟින් ඉහළ නැගෙනහිර ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ කිරින්ද ග්‍රාමයේ පිහිටි " තලගහවත්ත" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. එස්. කේ. වික්නරාජා විසින් සාදන ලද 2007 ජූනි 25 දිනැති අංක Ma/151 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට ආචාරිගෙවත්ත (පිඹුරු අංක 1068) හෙවත් මලපලාවත්ත සහ බොරොල්ලද නැගෙනහිරට නාපෙගෙහේනවත්තද දකුණට කිරින්ද සිට බෙලිඅත්ත දක්වා දිවෙන පාරෙහි සතරමංසන්ධියද බස්නාහිරට එකී අංක Ma/151 දරන පිඹුරෙහි ලොට් 2 ද මායිම්ව එකී අංක Ma/151 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් තිහයි දශම නවයක (අ. 0, රූ. 3, පර්. 30.9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි C581/277 හි ලියාපදිංචි කර ඇත.

2. එකී කිරින්ද ග්‍රාමයෙහි පිහිටි "තලගහවත්ත " නැමති ඉඩමෙහි එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්වූ අංක Ma/151 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල උතුරට ආචාරිගේවත්ත (අංක 1068 දරන පිඹුර ) හෙවත් මලපලාවත්ත සහ බොරොල්ලද නැගෙනහිරට එම ඉඩමේ ලොට් 1 ද දකුණට කිරින්ද සිට බෙලිඅත්ත දක්වා දිවෙන පාරෙහි සිවුමංසල ද බස්නාහිරට ලොට් 3 ද මායිම්ව එකී අංක Ma/151 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් තිහයි දශම නවයක (අ. 0 රූ. 3 පර්. 30.9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C581/278 හි ලියාපදිංචි කර ඇත.

මෙයට ඉහත දේපලට මේ සමග සවිකර ඇති දෙවන උපලේඛනයෙහි විස්තර කර ඇති යන්ත්‍ර සූත්‍ර ද වේ.

### දෙවන උපලේඛනය

1. 01 No. of Bell Sander – India
2. 03 No. of Wood Working Machines
3. Mortising Machine – Female
4. Mortising Machine – Male
5. Cross Cutting Machine – Angle
6. Cross Cutting Machine
7. Wood Turning Lathe Machine
8. Planer Long Bed
9. Wood Working Thickness Machine
10. Thicknesser Machine
11. Band Saw Machine
12. Compressor
13. Generator

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එම්. රත්නායක මිය,
ශාඛා කළමනාකාරිණී.

ලංකා බැංකුව,
හක්මණ.

07-450

---

### පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළෙහි කල්ගත නොවූ වසර 70 ක බදු අයිතිය, එහි දක්වා ඇති වේලාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුලත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ මරදන වෝඩ් 25 පංචිකාවත්තෙහි පිහිටි ශ්‍රී සංඝරාජ මාවත, වරිපනම් අංක 14 සහ මරදන පාර වරිපනම් අංක 79 හි පිහිටි පරිශ්‍රය වන එකී ලොට් 1 දරන ඉඩම් කැබැල්ල සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ සියල්ලම ඇතුලුව ඒවායේ බදුකර අයිතිය වේ. කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් අංක A 1097/37 යටතේ ලියාපදිංචි කර ඇත.

(බිම් ප්‍රමාණය : අ. 0-රූ. 0-පර්. 12.08)
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 01 වැනි දින පෙ.ව. 10.30 ට)

*දේපළට පිවිසෙන මාර්ගය* .- මරදන, කාර්මික විද්‍යාල මංසන්ධියේ මෙම දේපල පිහිටා ඇති අතර, ශ්‍රී සංඝරාජ මාවත සහ මරදන පාර ඔස්සේ ප්‍රවේශ මාර්ගය භාවිතා කෙරේ.

සංජය සේදර සෙනරත් සහ කලහෙ පණ්ඩිකෝරළලාගේ අරුණි මංජුලා කරුණාගොඩ විසින් කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී. නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.12.08 දිනැති අංක 4881 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය - සඳහා වර්ෂ 2016.06.03 වැනි දින ඩෙයිලි නිව්ස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින *ගැසට් පතද* බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහය)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරක වියදම් ද
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද
6. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 1,500/- ද

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු කළමනාකරු - ණය අයකරගැනීම් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667266.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත, කොළොන්නාව.
දුරකථන : 011-3068185 ෆැක්ස් : 011-2572940.

07-432

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේදී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුලත), සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුලත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත, පාගොඩ නැගෙනහිර අංක 519 සී ග්‍රාම නිලධාරී කොට්ඨාස ඇතුලත, මිරිහානෙහි පිහිටා ඇති (දූත් කෝට්ටේ පාරේ) ස්ටැන්ලි තිලකරත්න මාවතේ, වරිපනම් අංක 210 දරන, කැරකෑලගහවත්ත, නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් සකසන ලද වර්ෂ 1980/09/24 දිනැති අංක 2383 දරන පිඹුරේ ලොට් ඒ1ඒ ලෙස බෙද වෙන් කරන ලද (බලයලත් මානක වී.ජේ.එස්. දික්වෝර්ත් විසින් සකසන ලද වර්ෂ 1951.02.05 දිනැති අංක 713 දරන පිඹුරේ ලොට් ඒ1 හි ඉතිරි කොටසෙහි අනු බෙදීම්) ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ ඒ මත වූ අනෙකුත් සියල්ල ද සමග වේ. මෙය දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙලුම්/පත්ඉරු 18/82 යටතේ ලියාපදිංචි කර ඇත.

(විශාලත්වය : අ. 0, රූ. 0, පර්. 10)
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 08 වැනි දින පෙ.ව. 10.30 ට)

*දේපළට පිවිසෙන මාර්ගය.-* නුගේගොඩ හන්දියේ සිට ස්ටැන්ලි තිලකරත්න මාවත දිගේ ජුබිලි කණුව තෙක් ගමන් කරන්න. එකී පාරේ දකුණු පැත්තට වන්නට දේපල පිහිටා ඇත.

ඒසී ඇන්ඩ් ආර්එෆ් ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදයී" ලෙස ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. මධුමාලි අල්විස් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.02.24 දිනැති අංක 408 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය - සඳහා වර්ෂ 2017.06.30 වන දින තිනක්කුරල්, දි අයිලන්ඩ්, ලක්බිම පුවත්පත් සහ එදින *ගැසට් පතද බලන්න.*

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු කළමනාකරු - ණය අයකරගැනීම් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, අංක. 450, ගාලු පාර, කෙළඹ 03.

දුරකථන අංක : 011-4667230.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595, 0714755974, 0714962449.

07-433

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.